සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018 — 11 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை 2018 — தரம் 11
**Second Term Test 2018** — **Grade 11**

ඉස්ලාම් ධර්මය I — පැය එකයි
இஸ்லாம் - I — ஒரு மணித்தியாலம்
**Islam - I** — ***One hour***

❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

➢ නිවැරදි පිළිතුර තෝරන්න.

01. 'තවද නියත වශයෙන් නුඹ අතිශ්‍රේෂ්ඨ වූ යහගුණයන්ගෙන් හෙබිය.'
- (අල්කලම් : 4)

මෙම කුර්ආන් ආයතයේ නුඹ යනුවෙන් සඳහන් කරන්නේ,
1. මුහම්මද් නබි (සල්) තුමාණන්ව 2. යහගුණයෙන් යුතු මූඃමීන්වරයාව
3. ස්වර්ගවාසීන් යැයි සුභ පැතුම් ලද්දන්ව 4. සිව් මහා කලීෆාවරුන්ව

02. ඉස්ලාමයේ 'සබ්ර්' යනුවෙන් සඳහන් කරන්නේ,
1. කීකරු බව 2. වීරත්වය 3. ඉවසීම 4. සමාවදීම

03. හැඟීම් පාලනය කර භක්තිය , ඉවසීම , පරිත්‍යාගය වැනි උසස් ගුණාංග සඳහා පුහුණුව ලබා දෙන ඉස්ලාමීය ඉබාදතය,
1. සලාත් 2. zසකාත් 3. සවම් 4. හජ්

04. ඉබ්‍රාහිම් (අලෛ) තුමාණන්ව ගින්නට ඇද දැමූ අවස්ථාවේ එතුමා පැවසූ අවසාන වැකිය,
1. ඉන්ෂා අල්ලාහ් 2. හස්බියල්ලාහු වනිමල් වකීල්
3. ලා ඉලාහ ඉල්ලල්ලාහ් 4. සුබ්හානල්ලාහි වබිහම්දිහී

05. ඉස්ලාමීය ඉතිහාසයේ සහබාවරු 'බයිඅතුර්රිල්වාන්' අවස්ථාවේ පත් වූ තත්වය,
1. රිලා 2. මඃරිෆා 3. සබ්ර් 4. තවක්කුල්

06. ඉස්ලාමයේ ප්‍රධාන දෙවන නීති මූලාශ්‍රය වන්නේ,
1. අල්කුර්ආන් 2. අල් හදීස් 3. ඉජ්මා 4. කියාස්

07. අල්ලාහ් මිනිසාට රිසාලත් හිදායත් ලබා දුන්නේ,
1. ජින්වරුන් මගින් 2. සහාබාවරුන් මගින්
3. ඉමාම්වරුන් මගින් 4. රසූල්වරුන් මගින්

08. නබි සාලිහ් (අලෛ) තුමාගේ කාලයේ සිදු වූ විස්මයකි,
1. සැරයටිය නාගයකුගේ රුව ගැනීම. 2. ගල් පර්වතයකින් ඔටුවකු පිටවීම.
3. ගින්න සිසිලසක් වීම. 4. සඳ දෙකඩ වීම.

09. 'කෂ්ෂාෆ්' යන සාහිත්‍ය තෆ්සීර් ග්‍රන්ථය ලියූවේ,
1. අබ්දුල් කාදිර් ජීලානි (රහ්) තුමා 2. ඉමාම් පුලයිල් ඉබ්නු ඉයාල් (රහ්) තුමා
3. ඉමාම් සමකන්ෂරී (රහ්) තුමා 4. මහාචාර්යය කීත් මෝර්

10. 'අස්හාබුන්සුෆ්ෆාවරුන්' විශේෂ දායකත්වයක් දැක්වූයේ,
1. අල් කුර්ආනීය කලාවන්ට 2. හදීස් කලාවට
3. ෆික්හ් කලාවට 4. ඉස්ලාමීය ගොඩනැගිලි කලාවට

11. 'අස්සිහාහුස්සිත්තාහ්වට' අයත් නොවන ග්‍රන්ථය,
1. සහීහ් මුස්ලිම් 2. සූනනු නසාර් 3. තිර්මිද් 4. මුඅත්තා

12. සහීහ් මුස්ලිම්හි අඩංගු හදීස් සංඛ්‍යාව,
1. 7275 2. 4800 3. 4000 4. 3800

13. ඉජ්තිහාද්හි නිරතවන්නා,
1. මුෆස්සිරීන් 2. මුජ්තහීද් 3. මුහද්දිස් 4. මුජාහිද්

14. නවීන ගැටළු වලට විසඳුම් සෙවීමට දායක වෙමින් ඉස්ලාමය ප්‍රායෝගික දහමක් බවට පත් කිරීමට දායක වන්නේ,
1. අල්කුර්ආන් 2. අල් හදීස් 3. ඉජ්තිහාද් 4. උර්ෆු

15. අතීතයේ බොහෝ මද්හබ් බිහි වූවත් ප්‍රසිද්ධියට පත්ව වර්ධනය වෙමින් ආ මද්හබ් ගණන,
1. 01 යි. 2. 02 යි. 3. 03 යි. 4. 04 යි.

16. 'මද්රසතුර් රහ්යු' නම් චින්තන විප්ලවයෙන් යුත් ඉමාම්වරයා,
1. අබූ හනීෆා (රහ්) තුමා
2. ඉමාම් මාලික් (රහ්) තුමා
3. ඉමාම් හන්බලි (රහ්) තුමා
4. ඉමාම් ෂව්කානි (රහ්) තුමා

17. ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව , මැලේසියාව වැනි රටවල් අනුගමනය කරන මද්හබය,
1. හනෆි 2. මාලිකි 3. ෂාෆි 4. හන්බලි

18. මාලිකි මද්හබය ස්පාඤ්ඤයට හඳුන්වා දෙනු ලැබුවේ,
1. අබු යූසුෆ් 2. ෂයිබානි 3. සුෆර් 4. යහ්යා අන්දලූසි

19. භාෂා නිපුණත්වයෙන් ශ්‍රේෂ්ඨත්වයක් ඉසිලූ යුගයක පහළ වූ දහම,
1. තව්රාත් 2. සබූර් 3. ඉන්ජීල් 4. ෆුර්කාන්

20. ඉස්ලාමයේ 'අහ්ලාක්' යන මාතෘකාවෙන් පවසන්නේ,
1. සාරධර්ම පිළිබඳව
2. අපරාධ හා දඬුවම් පිළිබඳව
3. වෙළෙඳාම පිළිබඳව
4. නැමදීම් වතාවත් පිළිබඳව

21. 'නිශ්චය වශයෙන් .................. වනාහී අශිෂ්ට සම්පන්න නරක ක්‍රියාවන්ගෙන් ඔබ ආරක්ෂා කරයි.'' මෙම කුර්ආන් ආයතයේ සඳහන් වන ඉබාදතය,
1. කලිමා 2. සලාත් 3. zසකාත් 4. සව්ම්

22. අල්කුර්ආනයේ 'උලුල් අම්ර්' යනුවෙන් හඳුන්වන්නේ මොවුන් පිළිබඳව බව මුෆස්සිරීන්වරුන් පවසති. ඔවුන් නම්,
1. මුහද්දිස්වරු 2. මුජ්තහීද්වරු 3. මුජාහිද්වරු 4. මුජද්දිද්වරු

23. මී පැණිවල ඖෂධීය ගුණය ඇති බවට සඳහන් වන අල් කුර්ආන් සූරාව,
1. සූරා රූම් 2. සූරා බකරා 3. සූරා නම්ල් 4. සූරා හූද්

24. ''බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහි ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහි' යන දූආව පවසන්නේ,
1. නිවසින් පිටවන විට
2. නිවසට ඇතුළු වන විට
3. මස්ජිදයට ඇතුළු වන විට
4. මස්ජිදයෙන් පිටවන විට

25. ඉමාම් ෂාෆි (රහ්) තුමා හා ගැළපෙන පිළිතුර වන්නේ,
1. බැග්ඩෑඩයේ ඉපදී හැදී වැඩුණි.
2. 'ඉමාමුල් මදීනා' එතුමාගේ ගරු නමකි.
3. ෆික්හුල් අක්බර් එතුමාගේ ග්‍රන්ථයකි.
4. පලස්තීනයේ ගාසාහි ඉපදුණි.

26. හදීස් ආරක්ෂා කිරීමේ ප්‍රයත්නය ඇරඹූ කලීෆාවරයා,
1. අබූබක්ර් (රලි) තුමා
2. උමර්බින් අබ්දුල් අසීස් (රහ්) තුමා
3. මුආවියා (රලි) තුමා
4. කලීෆා මුතවක්කිල්

27. ගැත්තාගේ සිත 'කල්බුන් සලීම්' යන තත්වයට පත් වන්නේ,
1. ෂිර්ක් මගින් 2. රිද්දත් මගින් 3. මඃරිෆා මගින් 4. නිෆාක් මගින්

28. නබි (සල්) තුමා රුකානා සමග සිදු කළ ක්‍රීඩාව,
1. පිහිනීම 2. මල්ලව පොර 3. දිවීම 4. අශ්වාරෝහණය

29. අල්කුලෆාඋර්රාෂිදූන්වරයෙක් නොවන්නේ,
1. අබූබක්ර් (රලි) තුමා
2. උමර්බින් අබ්දුල් අසීස් (රහ්) තුමා
3. උස්මාන් (රලි) තුමා
4. අලි (රලි) තුමා

30. කලීෆා අබූබක්ර් (රලි) තුමා 'සිද්දීක්' යන නාමයෙන් හැඳින්වූයේ එතුමා,
1. ප්‍රථම හිජ්රතයට සහභාගී වූ නිසා
2. තම දියණියව නබිතුමාට විවාහ කර දුන් නිසා
3. මිහ්රාජ් ගමන ප්‍රථම වරට විශ්වාස කළ නිසා
4. ප්‍රථම කලීෆා වූ නිසා

31. අබූබක්ර් (රලි) තුමාගේ පාලන කාලය දැක්වෙන පිළිතුර හිජ්රි වර්ෂ,
1. 10 - 13 2. 11 - 14 3. 9 - 13 4. 11 - 13

32. උමර් (රලි) තුමා ඉස්ලාමය වැළඳ ගත්තේ,
1. නුබූව්වත් 5 2. නුබූව්වත් 6 3. නුබූව්වත් 7 4. නුබූව්වත් 8

33. උමර් (රලි) තුමාගේ පාලනයේ ඇති කළ 'වාලි' යනු,
1. ආණ්ඩුකරු 2. ප්‍රධාන ලේකම් 3. හමුදා ලේකම් 4. බදු නිළධාරී

34. උස්මාන් (රලි) තුමාණන්ව 'දූන්නූරයින්' යනුවෙන් හැඳින්වූයේ එතුමා,
1. අල්කුර්ආනය එක් රැස් කරවූ නිසා.
2. නාවික හමුදාවක් පිහිට වූ නිසා.
3. නබි (සල්) තුමාණන්ගේ දියණියන් දෙදෙනෙකු විවාහ කර ගත් නිසා.
4. බොහෝ කරුණාවන්ත වූ පුද්ගලයෙකු වූ නිසා.

35. උස්මාන් (රලි) තුමා හා නොගැළපෙන පිළිතුර,
1. සාක්ෂරතාවයෙන් යුතු අයෙකි.
2. ජාමිඋල් කුර්ආන් ලෙස ඇමතුහ.
3. මධ්‍යධරණී ප්‍රදේශ යටත් කර ගති.
4. අබූ ලූ:ලු විසින් ඝාතනය කරන ලදී.

36. උස්මාන් (රලි) තුමා ඝාතනයට ලක් වන විට එතුමාට වයස,
1. අවුරුදු 63 2. අවුරුදු 82 3. අවුරුදු 85 4. අවුරුදු 65

37. ඉස්ලාමය පිළිගත් ප්‍රථම දරුවා මෙතුමායි,
1. අබූබක්ර් (රලි) තුමා
2. උමර් (රලි) තුමා
3. උස්මාන් (රලි) තුමා
4. අලි (රලි) තුමා

38. අලි (රලි) තුමා අබූබක්ර් (රලි) තුමාගේ පාලන කාලයේ දැරූ නිලය,
1. නීතිපති 2. උපදේශක 3. බෛතුල්මාල් භාරකරු 4. ආණ්ඩුකරු

39. කලීෆා අලි (රලි) තුමාගේ කාලයේ ඇති වූ සටන්,
1. ජමල් - සිෆ්ෆීන් - කයිබර්
2. ජමල් - සිෆ්ෆීන් - නහර්වාන්
3. සිෆ්ෆීන් - කන්දක් - නහර්වාන්
4. නහර්වාන් - උහද් - කයිබර්

40. අලි (රලි) තුමාගේ පාලන අගනුවර වූයේ,
1. මදීනා 2. කූෆා 3. මක්කා 4. හිජාස්

**(ලකුණු 40)**

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11
**Second Term Test 2018** | **Grade 11**

ඉස්ලාම් ධර්මය II | පැය දෙක යි
இஸ்லாம் - II | இரண்டு மணித்தியாலம்
**Islam - II** | ***Two hours***

❖ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.
1. ඉවසීම ගැන සඳහන් හදීසයක් ලියන්න.
2. සබබ් යනු කුමක් ද?
3. වහීමත්ලූව් හා වහී හයිරු මත්ලූව් අතර වෙනස පැහැදිලි කරන්න.
4. නබිවරුන් දෙදෙනෙකුට ලැබුණු ප්‍රාතිහාර්යයන් 02 ක් නබිවරයා සමඟ සඳහන් කරන්න.
5. 'අස්සිහාහුස්සිත්තාහ්' යනු කුමක්ද?
6. මුජ්තහිද්වරයෙකුට තිබිය යුතු සුදුසුකම් 02 ක් සඳහන් කරන්න.
7. ෆික්හ් කලාවේ ඉමාම්වරු හා මද්හබ් නම් කරන්න.
8. මද්රසතුල්රහ්යු හා මද්රසතුල් අසර් අතර වෙනස පැහැදිලි කරන්න.
9. සුන්නාව හා සම්බන්ධ කව්ල් , ෆිඅල් යන පදවල තේරුම් ලියන්න.
10. ජාහිලියියාවේ ප්‍රසිද්ධියට පත් කවියෙකු සඳහන් කරන්න.

(ලකුණු 20)

02.
1. යහගුණාංග ගැන සඳහන් හදීසයක් ලියන්න.
2. ඉස්ලාමීය ආචාර ධර්ම 06 ක් සඳහන් කරන්න.
3. යහගුණාංග වල වැදගත්කම ගැන වාක්‍ය 06 ක් ලියන්න.

(ලකුණු 4 + 3 + 3 = 10)

03.
1. අල්කුර්ආනය නීති මූලාශ්‍රයකි යන්නට කරුණු 04 ක් ඉදිරිපත් කරන්න.
2. විද්‍යාත්මක ආශ්චර්යය පිළිබඳව ඇති කුර්ආන් වැකියක් ලියන්න.
3. හදීස් එක් රැස් වූ ඉතිහාසය පිළිබඳව කෙටියෙන් පහදන්න.

(ලකුණු 4 + 3 + 3 = 10)

04.
1. ෆික්හ් යන පදයේ අර්තය පැහැදිලි කරන්න.
2. ෆික්හ් කලාවේ බිහිවීම හා වර්ධනය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.
3. හදීස් එක් රැස් වූ ඉතිහාසය පිළිබඳව කෙටියෙන් පහදන්න.

(ලකුණු 2 + 4 + 4 = 10)

05.
1. අබූබක්ර් (රලි) තුමාගේ පෞරුෂ ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.
2. එතුමාගේ සේවා දායකත්වයන් 03 ක් සඳහන් කරන්න.
3. උමර් (රලි) තුමා කලීෆා ලෙස පත් වූ ආකාරය විස්තර කරන්න.

(ලකුණු 4 + 3 + 3 = 10)

06.
1. උස්මාන් (රලි) තුමාගේ සේවා දායකත්වයන් 04 ක් සඳහන් කරන්න.
2. අලි (රලි) තුමා මුහුණ දුන් ගැටළු පිළිබඳව විස්තර කරන්න.
3. අලි (රලි) තුමාගේ සේවාවන් 04 ක් නම් කරන්න.

(ලකුණු 4 + 2 + 4 = 10)

07. පහත මාතෘකා වලින් 02 ක් තෝරා කෙටි සටහන් ලියන්න.
1. සබ්ර් 2. තවක්කුල්
3. ඉවසීම 4. සමාවදීම

(ලකුණු 5 + 5 = 10)